## සැලැස්මට සම්බන්ධ අනෙකුත් තොරතුරු

- ඇතුලත්වීමේ වයස අවු 18 - 65 දක්වා කල්පිරීමේ වයස අවු 70 නොඉක්මවිය යුතුය.
- සැලසුම් කාලසීමාව අවු 5 - 40.
- අවම වාර්ෂික මූලික වාරිකය රු 6000.
- අවම තනි වාරිකය රු 15000.

## සැලසුම බල රහිත වුවහොත් සිදුවන්නේ කුමක්ද ?

පළමු වසර 3 ඇතුලත ඔබ විසින් ඔබගේ වාරික දින 30 ක සහන කාල සීමාව තුල නියමිත පරිදි ගෙවනු නොලැබූ විටක දී සැලසුම බල රහිත වන අතර ඔබ වෙත ප්‍රතිලාභයක් හිමි නොවනු ඇත. කෙසේ වුවද කොන්දේසි වලට යටත්ව සැලසුම නැවත බලගැන්වීමේ අවස්ථාව ඔබට හිමිවේ.

ඔබ විසින් වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් වාරික නිසිපරිදි ගෙවමින් සැලසුම පවත්වා ගෙනගොස් ඇත්නම් අත්‍යවශ්‍ය අවස්ථාවක දී සැලසුම මුදල් බවට පත්කර ගැනීමේ හැකියාව ඔබට හිමිවේ. කෙසේ වුවද සැලසුම සැලකියයුතු පවාරණ ගාස්තුවකට යටත්වන අතර එම ගාස්තුව සැලසුම පවත්වාගෙන ගොස් ඇති කාල සීමාව අනුව වෙනස් වේ. විකල්පයක් වශයෙන් පීවිතාවරණ ප්‍රතිලාභ රහිතව ඔබේ අරමුදල වර්ධනය වීමට ඉඩහරිමින් කල්පිරීමේ වැඩි වටිනාකමක් ලබා ගැනිමට ද ඔබට හැකි වේ.

076 50 20 300
011 200 2021

සනස Life
සනස ලයිෆ් ඉන්ෂුරන්ස්
SANASA LIFE INSURANCE

340 2/1, ආර් . ඒ . ද මෙල් මාවත , කොළඹ 03

# සණස ජීවිත ආයෝජන



සනස Life
සනස ලයිෆ් ඉන්ෂුරන්ස්
SANASA LIFE INSURANCE

අප සියළුදෙනා සතු සිහින හා අපේක්ෂාවන් රාශියකි. එම සිහින සැබෑ කරගැනීම සඳහා අපි බැංකු ඉතුරුම් ගිණුම්, ස්ථාවර තැන්පතු වැනි සාම්ප්‍රදායික ඉතුරුම් ක්‍රම අනුගමනය කිරීම සාමාන්‍ය සිරිතයි. කෙසේවුවත්, ඉහත ඉතුරුම් ක්‍රම මඟින් ඇතැම්විට අප බලාපොරොත්තු වූ අපේක්ෂාවන් එලෙසින්ම හිමි නොවීමටද ඉඩ ඇත .

සණස ජීවිත ආයෝජන සැලැස්ම මඟින් ඔබට වඩාත්ම උචිත ආයෝජන ක්‍රමවේදයක් තෝරාගැනීමේ අවස්ථාව හිමිවේ. එමගින් ඔබේ ආයෝජනයට උපරිම ප්‍රතිලාභ හිමිකර ගැනීමේ අවස්ථාව ඔබ සතුය. එපමණක් නොව ඔබට හා ඔබේ ආදරණීයන් වෙත ජීවිත රක්ෂණ ප්‍රතිලාභ රැසක් හිමිකර දීමෙන් ඔබේ සිහින හා අපේක්ෂාවන් වඩාත් සුරක්ෂිත කරයි.

## සණස ජීවිත ආයෝජන සැලැස්මේ ඇති විශේෂත්වයන්

කල්පිරීමේ දී බදු වලින් නිදහස් ඉතුරුම් අරමුදලක්.

ඔබටම ගැලපෙන ජීවිත ආවරණයක්.

ඔබ නැතත් ඔබගේ පවුලේ මාසික ආදායම සුරක්ෂිත කිරීමේ හැකියාව.

ඔබේ ඉතුරුම් උද්ධමනයේ අහිතකර බලපෑමෙන් සුරක්ෂිත කිරීමේ හැකියාව.

ඔබ ඔබගේ කලත්‍රයා හා ඔබගෙ දරුවන් සුරක්ෂිත කිරීම සඳහා අතිරේක ප්‍රතිලාභ රැසක්.

අමතර සෞඛ්‍ය සහ රැකවරණ ප්‍රතිලාභයන් මඟින් රෝහල් ගතවීම්, බරපතල රෝගාබාධ සහ සැත්කම් ද ආවරණය වේ.

# සණස ජීවිත ආයෝජන

## ඔබගෙ ඉතුරුම් අරමුදල ගොඩනැගෙන ආකාරය

මේ වර්ෂයේ දී ඔබේ වයස අවු 30 නම්, වසර 15 ක සැලසුමක් තෝරාගත්තේ නම්, ඔබෙ ඉතුරුම් අරමුදලේ ප්‍රක්ෂේපිත වටිනාකම් පහත පරිදි වනු ඇත.

| වාර්ෂික මූලික වාරිකය | ප්‍රක්ෂේපිත ඉතුරුම් අරමුදල | | |
|---|---|---|---|
| | 6% වාර්ෂික | 8% වාර්ෂික | 10% වාර්ෂික |
| 100 000 | 2 021 398 | 2 368 294 | 2 780 938 |
| 200 000 | 4 049 895 | 4 744 746 | 5 571 300 |

ශ්‍රී.ල.රු.

ඉහත ප්‍රක්ෂේපිත වටිනාකම් හුදෙක් නිදර්ශනයක් වන බව සලකන්න. මෙහි දක්වා ඇති ඉපැයීම් අනුපාතයන් වාර්ෂිකව වෙනස් වේ. එමෙන්ම මෙම අනුපාතයන් ඔබට ලැබිය හැකි ඉහලම හෝ පහළම අනුපාතයන් නොවේ. කල් පිරීමේදී ඔබට ලැබෙනුයේ ඔබේ අරමුදලේ වටිනාකම වේ.

## සණස ආයෝජන සැලැස්ම සඳහා වන අමතර ප්‍රතිලාභ

### අතිරේක ජීවිත රක්ෂණ ප්‍රතිලාභ

සුළු මුදලක් අමතරව ගෙවීමෙන් මූලික ජීවිතාවරණය වැඩිකර ගත හැකිය. මෙයින් ඔබෙ පවුලේ සුරක්ෂිතභාවය වඩාත් තහවුරුවේ.

### හදිසි අනතුරු ප්‍රතිලාභය

හදිසි අනතුරකින් සිදුවන වියෝවක දී ඔබේ යැපෙන්නන් හට මෙයින් වැඩි රැකවරණයක් හිමි වේ. එයට අමතරව ඔබට පූර්ණ නිත්‍ය අකර්මන්‍යතාවයකට මුහුණ දීමට සිදුවුවහොත් මූල්‍යමය රැකවරණ මෙයින් සැලසෙනු ඇත.

### රෝහල් ගතවීමේ ප්‍රතිලාභය

ඔබ දින 3 කට වඩා රෝහල් ගතවී සිටියේ නම් සෑම දිනකටම (ඇතුලත් කල දිනයේ සිටම) රු 10,000 ක උපරිමයක් දක්වා මුදල් ලබා දේ. දැඩිසත්කාර ඒකකයට ඇතුලත් කලහොත්, ලැබෙන එම මුදල දෙගුණවේ.

### බරපතල රෝග ආවරණය

සැලසුමේ නිර්වචනය පරිදි බරපතල රොගී අවස්ථාවකදී ඔබට හා ඔබගේ කලත්‍රයාට මූල්‍යමය ආධාර ලබාදෙයි.

### අවමංගල්‍යාධාර වියදම්